දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

# ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය
# ECG 2.2 - Macroeconomic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
ගණකයන්ත්‍ර භාවිතයට අවසර ඇත

---

01. i. 'ව්‍යාපාර චක්‍ර' (Business Cycle) යන්න නිර්වචනය කොට එහි විවිධ අවධි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. "ධනවාදී ආර්ථිකයක නෛසර්ගික ලක්ෂණයක් වන 'ව්‍යාපාර චක්‍ර' වනාහී ව්‍යාපාරිකයින්ගේ අපේක්ෂිත ලාභ අනුපාත වෙනස්වීමේ ගතික ප්‍රතිවිපාකයයි." (ජෝන් මේනාඩ් කේන්ස් 1936) සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

02. පහත සඳහන් එක් එක් සංකල්ප යුගලයන් අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

i. ශුද්ධ ජාතික නිෂ්පාදිතය සහ ජාතික ආදායම
ii. ජාතික ආදායම සහ කුටුම්භ (පුද්ගල) ආදායම
iii. රජයේ අයවැය හිඟය සහ වෙළෙඳ ශේෂයේ හිඟය
iv. සමස්ත ඉල්ලුම සහ සඵල ඉල්ලුම

(එක් කොටසකට ලකුණු 05 බැගින් මුළු ලකුණු 20)

03. රජයේ කටයුතු සහ විදේශ වෙළෙඳාම සහිත කල්පිත විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන් කිහිපයක වටිනාකම් පහත පරිදි ඇස්තමේන්තු වී ඇතැයි සිතන්න. ඒවා උපයෝගී කොට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (සියලුම ස්වායත්ත සංඛ්‍යා රු.ද.ල. වලිනි)

| | | | |
|---|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | $C$ | = | $140 + 0.75\,(Yd)$ |
| රජයේ බදු ආදායම | $Tn$ | = | $20 + 0.2\,Y$ |
| රජයේ භාණ්ඩ හා සේවා මත වියදම් | $G$ | = | 25 |
| පෞද්ගලික ආයෝජන වියදම් | $I$ | = | 50 |
| ශුද්ධ අපනයන | $Xn$ | = | $5 - 0.1Y$ |

i. මෙම ආර්ථිකය හා සම්බන්ධ පහත දෑ ගණනය කරන්න.

a) සමතුලිත ජාතික ආදායම
b) සමතුලිත ආදායමේ දී පෞද්ගලික පරිභෝජන වියදම සහ ඉතිරිකිරීම්
c) සමතුලිත ආදායමේ දී ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය

(ලකුණු 12)

ii. ජාතික ආදායම් මට්ටම රු.ද.ල. 100 කින් ඉහළට ගෙන යාම සඳහා මෙම ආර්ථිකයට ඇති විකල්ප ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග දෙකක් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

04. i. එම න්‍යාය පදනම් වී ඇති තර්කයන් සහ උපකල්පන පැහැදිලිව දක්වමින් 'ආදායම සහ සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය' යේ නිගමනය සනාථ කරන්න.

(ලකුණු 14)

ii. මතු සඳහන් න්‍යායයේ ප්‍රායෝගික වලංගුතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 06)

05. එක්තරා ආර්ථිකයක් පහත සඳහන් සමීකරණ මගින් විස්තර වේ යැයි සිතන්න. (දත්ත රුපියල් මිලියන වලිනි)

| | | | |
|---|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | C | = | 100 + 0.80 ($Yd$) |
| රජයේ බදු ආදායම | $Tn$ | = | 50 |
| රජයේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මත වියදම | G | = | 100 |
| පෞද්ගලික ආයෝජන වියදම | I | = | 140 - 15 $i$ |
| මුදලට ඇති ඉල්ලුම | L | = | 0.20 $Y - 5\,i$ |
| මූර්ත මුදල් සැපයුම | $M$ | = | 200 |

i. මෙම ආර්ථිකය සඳහා වන IS ශ්‍රිතය ගොඩ නගන්න.

(ලකුණු 05)

ii. මෙම ආර්ථිකය සඳහා වන LM ශ්‍රිතය ගොඩ නගන්න.

(ලකුණු 03)

iii. සමතුලිත ජාතික ආදායම, පොළී අනුපාතිකය සමතුලිත ජාතික ආදායමට අදාලව වන පෞද්ගලික පරිභෝජන වියදම හා ආයෝජන වියදම ගණනය කරන්න.

(ලකුණු 07)

iv. රජයේ සේවකයින්ගේ වැටුප ඉහළ දමනවාය යන දේශපාලනික පොරොන්දුවක් ඉටු කිරීම මත රජයේ වියදම් රුපියල් මිලියන 50 කින් ඉහළ දැමීමකට සැලසුම්වන විටෙක මෙම ආර්ථිකය මත ඇතිවන ඍජු ප්‍රතිවිපාක ගණනය කොට සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

06. i. පැහැදිලි කිරීමට අවශ්‍ය වන උපකල්පන නිවැරදිව දක්වමින් මූල්‍යවාදී න්‍යායට අනුව මිල උද්ධමනයට හේතු විස්තර කෙරෙන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. සාපේක්ෂ ඉහළ උද්ධමනයක් මගින් ආර්ථිකයක් මත ඇති කළ හැකි ප්‍රතිවිපාක කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

07. i. අදාළ කරගත හැකි උපකල්පන පැහැදිලිව දක්වමින් සහ සංඛ්‍යානමය උදාහරණයක් උපයෝගී කොට ගනිමින් වාණිජ බැංකු පද්ධතියක මුදල් මැවීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

ii. වාණිජ බැංකු මුදල් මැවීමේ හැකියාව සීමා කරනු ලබන සාධක කවරේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

08. i. ආර්ථිකයක පටු මුදල් සැපයුම (M1 = Narrow Money Supply) සහ අධි බලැති මුදල් (High Powered Money) යන සංකල්ප දෙක අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 08)

ii. මුදල් සැපයුම පිළිබඳ මුදල් ගුණක න්‍යාය පැහැදිලි කරන්න.
(ලකුණු 12)

09. i. නිරපේක්ෂ පිරිවැය වාසි සහ සාපේක්ෂ පිරිවැය වාසි යන සංකල්ප දෙක අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 05)

ii. සාපේක්ෂ පිරිවැය වාසි න්‍යාය මගින් එළඹෙන නිගමනය දක්වා එම නිගමනය සරල උදහරණයක් මගින් සනාථ කොට පෙන්වන්න.
(ලකුණු 15)

10. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳව විග්‍රහාත්මක කෙටි සටහන් ලියන්න.
   i. මුදල් ඉල්ලුම පිළිබඳ ද්‍රවශීලතාවරණ න්‍යාය
   ii. කේන්සියානු පරිභෝජන ශ්‍රිතය
   iii. මූල්‍ය වාදය සහ ෆිෂර්ගේ විනිමය සමීකරණය
   iv. ආදායම සහ සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳ කේන්සියානු න්‍යාය

(එක් කොටසකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 20)

************************************